ආණමඩුව ප්‍රාදේශීය සභාව
පුත්තලම දිස්ත්‍රික්කය
-----------------------------

**2.** **මූල්‍ය ප්‍රකාශන**
---------------

**2.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2016 මාර්තු 30 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**2.1** **තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

රු.1,428,910 ක් වූ තොග වටිනාකම් දෙකක්, රු.30,036,549 ක් වූ වගකීම් දෙකක්, රු.3,345,505 ක් වූ ලැබිය යුතු වටිනාකම් හතරක් සහ රු.190,400 ක් වූ වත්කම් අයිතමයක් වශයෙන් වූ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
-------------------------

ගිණුම් විෂයයන් හයකට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ ඒවාට අදාල උපලෙඛනවල පැවති ශේෂයන් අතර රු.15,676,008 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට රු.30,786,832 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂවලින් වර්ෂ 03කට වඩා වැඩි කාලයක් තුළ හිඟ හිට තිබෙන රු.2,998,039 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට රු.77,751,643 ක් වූ ගෙවිය යුතු ගිණුම්වලින් රු.12,701,061 ක් වර්ෂ 05කට වඩා වැඩි කාලයක් තුල නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.4** **විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**
--------------------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාල එකතුව රු.4,016,281 ක් වූ වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීම සඳහා වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදි.

**1.3.5 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 158 වගන්තිය | සභා බල ප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රා දේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (i) 5 (7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) 65 රීතිය | සභාවට ලැබිය යුතු ආදායම් ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාමලේඛනයක් පිළියෙල කර ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.59,848,724 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,935,349 ක් විය.

**2.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සභාවේ උත්පාදිත ආදායම රු.5,353,189 කින් සහ වෙනත් ආදායම් රු.43,734,626 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ගිණුම්වලට අනුව කාරක ප්‍රාග්ධන අනුපාතය 1.5:1 ක් විය. ඉකුත් වර්ෂයේ දී ද මෙම අනුපාතය සමාන අගයක් විය.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 18.5 ක්වූ අතර, තථ්‍ය ආදායම රු.මිලියන 14.5 ක් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.5 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4.5 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.මිලියන 16 ක් වූ අතර, වර්ෂය තුල රැස්කිරීම රු.මිලියන 13 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්කල ආදායමින් රු.මිලියන 3 ක් අයවීමට තිබුණි.

### 2.4.2 වරිපනම්

පෙර වර්ෂවලට සහ සමාලෝචිත වර්ෂයට අදාලව පිළිවෙලින් රු.2,348,556 ක් සහ රු.2,249,966 ක් වශයෙන් හිඟ වරිපනම් අයකර ගැනීමේ ප්‍රමාදයක් සිදුවී තිබුණි.

### 2.4.3 කුලී

පෙර වර්ෂවලට සහ සමාලෝචිත වර්ෂයට අදාලව පිළිවෙලින් රු.118,430 ක් සහ රු.62,185 ක් වූ හිඟ කුලී අයකර ගතයුතුව තිබුණි.

### 2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>උසාවි දඩ</u>
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ ඇස්තමේන්තුකර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) <u>මුද්දර ගාස්තු</u>
හලාවත, නිකවැරටිය හා පුත්තලම යන අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල තුනෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන ඇගයීම

2016 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් අයකළයුතු රු.429,575 ක් වූ ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය භෞතික සම්පත්

පිරිවැය රු.597,668 ක් වූ ට්‍රැක්ටරය සහ වටිනාකම ඇස්තමේන්තු නොකල මිනි කුබෝටා ට්‍රැක්ටරය වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3.4 හඳුනාගත් අලාභ

විධිමත් සක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර රු.2,256,000 ක් වැයකර සභා භූමියේ ඉදිකර තිබූ කසල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති බවට තීරණය කර නව මධ්‍යස්ථානයක් සභා භූමියෙන් පිටත ඉදිකිරීමට පියවර ගෙන තිබුණි.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

දෛනිකව එකතු කරනු ලබන කසළ මෙට්‍රික් ටොන් 02න් 01 ක් පමණ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට යොදා ගන්නා අතර, ඉතිරි කසල විධිමත් අයුරින් බැහැර නොකිරීම හේතුවෙන් පාරිසරික ගැටළු මතුවිය හැකිව තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවේ සංවර්ධන හා අනෙකුත් කාර්යයන් පුළුල්වී තිබුණ ද, 2013 වර්ෂයේ දී අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ දී පිළියෙල කල කාර්යය මණ්ඩල විස්තරය පරිදි සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකු අනුමතව සිටිය ද සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ස්ථිර නිලධාරීන් දෙදෙනකු පමණක් සේවයේ යෙදී සිටි අතර, තවත් සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු සභාවට අනුයුක්ත කර තිබුණි.

(iii) 2013 වර්ෂයේ දී ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 14 ක් වෙනුවෙන් සේවකයින් 58 දෙනෙකු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එම ශ්‍රේණියේ තනතුරු 14 වෙනුවෙන් 66 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ඒ අනුව, ප්‍රාථමික තනතුරු 05 ක පුරප්පාඩු 09 පැවති අතර, එම තනතුරුවලම 17 දෙනෙකු අතිරික්තව තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ 2010 ඔක්තෝබර් 05 දිනැති අංක ව/ප්‍ර/ලේ/05/03 විගණන කමිටු දරන ලිපිය ප්‍රකාරව වර්ෂය තුල කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, එක් රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේ දී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දුර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මගින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | අයවැය ලේඛන | අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම් විස්තරාත්මකව දක්වා නොතිබුණි. |
| (ආ) | ආදායම් පාලනය | හිඟ ආදායම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ණයගැති හා ණයහිමි | සමහර ණයගැතියන් හා ණයහිමියන් සනාථ කර ගැනීම් කර නොතිබුණි. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | සභාව සතු ඉඩම් මැන වෙන්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | තොග | විධිමත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඊ) | කසළ කළමනාකරණය | දෛනිකව එකතුවන සියළුම කසළ ප්‍රමාණය පරිසර හිතකාමී අයුරින් යොදා ගැනීමට සැලසුම් කර නොතිබීම. |